

# අරක්කු, සිගරට් නිසා අපේ

# ළමා

## අයිතිවාසිකම් අහිමිවන බව

# ඔබ දන්නවාද ?

තාත්තා බීලා
හැමවෙලේම රණ්ඩුවෙනවා. ගෙදර
වියදමටවත් සල්ලි දෙන්නේ නෑ කියලා
අම්මා කියනවා. මේ ඔක්කොම නිසා
අන්තිමට, අම්මයි මමයි තාත්තාගෙන්
වෙන්වුණා. මම තාත්තාට හුඟාක්
ආදරෙයි. මේ බීමත්කම නිසාම මගේ
තාත්තා මගෙන් දුරස්වුණා.



**"දෙමව්පියන් දෙදෙනාම ළමයාගේ වැඩීම හා වර්ධනය පිළිබඳව සමසේ වගකීම දැරිය යුතුය"**

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය- 18 වන වගන්තිය

තාත්තා වැඩට යන්නෙත්
වැඩ ඇරිලා ගෙදර එන්නෙත් සිගරට් එක
අතේ තියාගෙනමයි. චුටි හෙම්බිරිස්සාවටත්
බයවෙලා දොස්තර ගාවට ඉක්මනටම මාව
එක්ක යන මගේ තාත්තට, සිගරට් එකෙන්
එයාටයි මටයි වෙන ලොකු හානිය ගැන
අමතක වෙලා. දැන් මට වඩා
මගේ තාත්තා ගාව ඉන්නෙ සිගරට් එක.



**"මනා සෞඛ්‍යයකින් යුක්තවීමට ළමයාට ඇති අයිතිය"**

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය- 24 වන වගන්තිය

ගොඩාක් වෙලාවට ටීවී
එකේ යන නාට්‍යවල, කාටූන්වල
විනෝදවෙන අවස්ථාවලදි,
අරක්කු/බියර්/සිගරට් තියෙනවමයි.
ඒත් අපේ අම්මා කියන්නේ මේ දේවල්වලින්
වෙන්නෙ, සතුට නැතිවෙන එක
විතරයි කියලා. ඒත් ඇයි ඒ නාට්‍යවල,
කාටූන්වල ඉන්න අය විනෝදවෙන්න මේ
දේවල් තියෙන්න ඕනෙ කියන්නෙ ?




**"නිවැරදි තොරතුරු ලබාගැනීමට ළමයාට ඇති අයිතිය"**

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය- 17 වන වගන්තිය

කලින් අපි හිටියෙ
අපේම ගෙදර ඒත් අපි දැන් ඉන්නේ කුලී
ගෙදරක. තාත්තගේ බීමත්කම නිසාම එයාට
කලින් කරපු රස්සාවත් නැති වුණා කලින් අපි
තුන් වේලම කෑවත්, දැන් අපිට එහෙම කන්න
ලැබෙන්නෙ නෑ. මේ බීමත්කම නිසාම නැතිවුන
දේවල් අතරෙ මට දරාගන්න අමාරුම දේ,
මගේ ඉස්කෝලෙ ගමනත් නවත්තන්න
උන එක ගැනයි.



**"මනා ජීවන තත්ත්වයකට හිමිකම් කීමට ළමයාට ඇති අයිතිය"**

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය- 27 වන වගන්තිය

**"අධ්‍යාපනය ලැබීමට සියලුම ළමුන්ට අයිතියක් ඇත"**

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය- 28 වන වගන්තිය



# අපේ ළමා

## අයිතිවාසිකම් වෙනුවෙන්

# ඔබගේ වගකීම

# ඉටුකරන්න කාලයයි මේ.

- ළමා අයිතින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය ඇසුරෙනි -

**ඔබට අවශ්‍ය සහය ලබා ගැනීමට**

- එක්වන්න අප සමඟ -

අදහස් අපට ලියන්න
මත්පැන් සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය
40/18, උද්‍යාන පාර කොළඹ 05.
දුක: 011-2584416/011-2592515
ෆැක්ස්: - 011-2508484
www.adicsrilanka.org